# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2321/67 - 2023 මාර්තු මස 02 වැනි බ්‍රහස්පතින්දා - 2023.03.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත**

3 වැනි වගන්තිය යටතේ නියමය

සංශෝධිත පරිදි වූ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, මෙහි උප ලේඛනයේ I තීරුවෙහි නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, එම උප ලේඛනයෙහි II තීරුවෙහි අනුරූප සටහනෙහි සඳහන් මායිම් හා ඉම් සලකුණු නිශ්චිතව දක්වා ඇත්තා වූද, ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, ඒ ප්‍රදේශය ඒ වගන්තියේ කාර්ය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතුයැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

**ප්‍රසන්න රණතුංග** (පා.ම),<br>
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2023 පෙබරවාරි මස 20 වැනි දින,<br>
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය,<br>
17 හා 18 මහල,<br>
"සුහුරුපාය",<br>
සුභූතිපුර පාර,<br>
බත්තරමුල්ල.

1A - G 39004— 21 (2023/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය I

### වැල්ලවාය නාගරික සංවර්ධන බල ප්‍රදේශය පුළුල් කිරීම.

*I වැනි තීරුව*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1986.11.13 දිනැති සහ අංක 427/15 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රය අනුව, නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද මොනරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය නාගරික සංවර්ධන බල ප්‍රදේශයට අයත් වන්නා වූ අංක 151 වැල්ලවාය සහ 152 කොටිකම්බොක්ක යන ග්‍රාම නිලධාරි වසම්වල කොටස් ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* අනුව, නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කල අංක 1605/41 හා 2009.06.11 දරන මොනරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය නාගරික ප්‍රදේශයට අයත් වන්නා වූ අංක 150M කිතුල්කොටේ කොටසක්, අංක 150L දෙබරආර, අංක 150A බලහරුව, අංක 150D කුඩා ඔය කොටසක්, අංක 150K තෙළුල්ල ජනපදය, 150G මහආරගම, 150 තෙළුල්ල, 150J ඇතිලිවැව, 150I සිරිපුරගම, 150H වෙහෙරයාය ජනපදය, 150C වෙහෙරයාය ගම, 150E රන්දෙනාගොඩයාය, 150B හඳපානාගල, 151F ආඳවෙලයාය කොටසක්, 151E බුදුරුවගල, 151G නෙළුවගල, 150F පුබුදුවැව, 151D නුගයාය, 151B වරුණගම, 151A ආනපල්ලම, 152B දිඹුලාමුරය, 152A ගල්බොක්ක, 152C සුදුපනාවෙල, 153B සියඹලාගුණය කොටසක්, 153A රන්දෙණිය කොටසක් ද යන ග්‍රාම නිලධාරි වසම්වලට අමතරව අංක 151C යාලබෝව ග්‍රාම නිලධාරි කොට්ඨාසය ද, අංක 152 දරන කොටිකම්බොක්ක ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටස ද, අංක 151 දරන වැල්ලවාය ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටස ද, අයත් වන්නා වූ මෙහි II වන තීරුවෙන් විස්තර වන්නා වූ මුළු මහත් භූමි ප්‍රමාණය වේ.

*II වැනි තීරුව*

උතුරට :

අංක 152 කොටිකම්බොක්ක ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම අංක 153 කුරුගම ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම ඡේදනය වන ලක්ෂ්‍යයෙන් ආරම්භ වී අංක 152 කොටිකම්බොක්ක ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම ඔස්සේ ගිණිකොණ, ඊසාන, නැගෙනහිර දිශානුගතව ඇදි රේඛාව අංක 153 කුරුගම ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද, එතැන් සිට අංක 153 කුරුගම ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම ඔස්සේ උතුරු දිශානුගතව ඇදි රේඛාව ඇල්ල - වැල්ලවාය මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට ඇල්ල - වැල්ලවාය මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ දකුණු දිශානුගතව ඇදි රේඛාව ඇල්ල - වැල්ලවාය මාර්ගයේ මධ්‍ය රේඛාව සහ රන්දෙණිය - සියඹලාගුණය මාර්ගයේ මධ්‍ය රේඛාව ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට රන්දෙණිය - සියඹලාගුණය මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ නැගෙනහිර දිශානුගතව ඇදි රේඛාව අංක 153B සියඹලාගුණය ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද,

නැගෙනහිරට :

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අංක 153B සියඹලාගුණය ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම ඔස්සේ දකුණු හා නිරිත දිශානුගතව ඇදි රේඛාව අංක 153B සියඹලාගුණය ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම් අංක 152C සුදුපානාවෙල ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට අංක 152C සුදුපානාවෙල ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම ඔස්සේ ගිණිකොණ දිශානුගතව ඇදි රේඛාව අංක 151A ආනපල්ලම ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට අංක 151A ආනපල්ලම ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම ඔස්සේ ගිණිකොණ හා දකුණු දිශානුගතව ඇදි රේඛාව අංක 150F පුබුදුවැව ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට අංක 150F පුබුදුවැව ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම ඔස්සේ දකුණු දිශානුගතව ඇදි රේඛාව අංක 150F පුබුදුවැව ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට අංක 150F පුබුදුවැව ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම ඔස්සේ දකුණු දිශානුගතව ඇදි රේඛාව අංක 150G මහආරගම ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද,

උපලේඛනය I (*සම්බන්ධිතයි* )

**වැල්ලවාය නාගරික සංවර්ධන බල ප්‍රදේශය පුළුල් කිරීම.**

*I වැනි තීරුව* *II වැනි තීරුව*

එතැන් සිට අංක 150G මහආරගම ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම ඔස්සේ දකුණු හා ගිණිකොණ දිශානුගතව ඇඳි රේඛාව අංක 150D කුඩා ඔය ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට අංක 150D කුඩා ඔය ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම ඔස්සේ ගිණිකොණ දිශානුගතව ඇඳි රේඛාව ලුණුගම්වෙහෙර ජාතික වනෝද්‍යාන රක්ෂිතයේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට අංක 150D කුඩා ඔය ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම ඔස්සේ නිරිත දිශානුගතව ඇඳි රේඛාව කුඩා ඔයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට කුඩා ඔයේ මධ්‍ය රේඛාව ඔස්සේ දකුණු දිශානුගතව ඇඳි රේඛාව අංක 150M කිතුල්කොටේ ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද,

දකුණට :

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අංක 150M කිතුල්කොටේ ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම ඔස්සේ වයඹ දිශානුගතව ඇඳි රේඛාව තණමල්විල -වැල්ලවාය ප්‍රධාන මාර්ගය මධ්‍යය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට අංක 150M කිතුල්කොටේ ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම ඔස්සේ නිරිත, වයඹ දිශානුගතව ඇඳි රේඛාව අංක 150A බලහරුව ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට අංක 150A බලහරුව ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම ඔස්සේ ගිණිකොණ, දකුණ, නිරිත, වයඹ දිශානුගතව අඳින ලද රේඛාව අංක 150A බලහරුව ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම ආරම්භවන ලක්ෂ්‍යය දක්වා ද,

බටහිරට :

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අංක 150A බලහරුව ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම ඔස්සේ ගිණිකොණ, උතුර, වයඹ, උතුර හා ගිණිකොණ දිශානුගතව ඇඳි රේඛාව අංක 150I සිරිපුරගම ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට අංක 150I සිරිපුරගම ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම ඔස්සේ උතුරු, ගිණිකොණ, වයඹ හා උතුරු දිශානුගතව ගමන් කරන විට හමුවන අංක 151F ආඳවෙලයාය ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට අංක 151F ආඳවෙලයාය ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම ඔස්සේ උතුරු දිශානුගතව ඇඳි රේඛාව අංක 151E බුදුරුවගල ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම හමුවන ලක්ෂ්‍යය

**උපලේඛනය I** (*සම්බන්ධිතයි* )

**වැල්ලවාය නාගරික සංවර්ධන බල ප්‍රදේශය පුළුල් කිරීම.**

*I වැනි තීරුව*

*II වැනි තීරුව*

දක්වා ද, එතන් සිට අංක 151E බුදුරුවගල ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම ඔස්සේ උතුරු දිශානුගතව ඇඳි රේඛාව අංක 151D නුගයාය ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට අංක 151D නුගයාය ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම ඔස්සේ ඇඳි රේඛාව අංක 151C යාලබෝව ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම හමුන ලකෂ්‍යය දක්වා ද, එතැන් සිට අංක 151C යාලබෝව ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම ඔස්සේ උතුරු දිශානුගතව ඇඳි රේඛාව අංක 151 වැල්ලවාය ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට අංක 151 වැල්ලවාය ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම ඔස්සේ උතුරු දිශානුගතව ඇඳි රේඛාව කොළඹ - මඩකලපුව A4 (කොස්ලන්ද පාර) මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට එම මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ඊසාන දිශානුගතව ඇඳි රේඛාව නැවතත් අංක 151 වැල්ලවාය ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට නැවතත් අංක 151 වැල්ලවාය ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම ඔස්සේ උතුරු දිශානුගතව ඇඳි රේඛාව අංක 152B දිඹුලාමුරය ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට අංක 152B දිඹුලාමුරය ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම ඔස්සේ බටහිර උතුරු දිශානුගතව ඇඳි රේඛාව අංක 152A ගල්බොක්ක ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට අංක 152A ගල්බොක්ක ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම ඔස්සේ උතුරු දිශානුගතව ඇඳි රේඛාව අංක 152 කොටිකම්බොක්ක ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට අංක 152 කොටිකම්බොක්ක ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම ඔස්සේ උතුරු දිශානුගතව ඇඳි රේඛාව ආරම්භක ලක්ෂ්‍යය දක්වා ඇතුළත් මුළු භූමි ප්‍රදේශය වේ.

EOG 03- 0017

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.